# කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය (UCSC)
# පුරප්පාඩු

ශ්‍රී ලංකාවේ පරිගණක හා ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල උපාධි හා පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබාදෙන ප්‍රමුඛ උසස් අධ්‍යාපන ආයතනයක් වන කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය (UCSC) විසින් පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් **2026 අගෝස්තු 10** දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **විදුලි කාර්මික III ශ්‍රේණිය**

- **<u>අධ්‍යාපනික සුදුසුකම්:</u>**

  - ➢ විදුලි කාර්මික තනතුරේ කාර්යයට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් තිබිය යුතුය.

  - ➢ වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

- **<u>පහත සඳහන් කරුණු පිළිබඳව නිපුණත්වයක් තිබීම සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ:</u>**

• එක-පියවර (Single-phase) හා තුන්-පියවර (Three-phase) විදුලි පද්ධති ස්ථාපනය සහ නඩත්තු කිරීමේ පළපුරුද්ද තිබිය යුතුය.

• විදුලි දෝෂ පරීක්ෂා කිරීම, හඳුනා ගැනීම හා විසඳීමේ සනාථ කළ හැකි හැකියාව තිබිය යුතුය.

• MDB (Main Distribution Boards), DB (Distribution Boards), ජෙනරේටර්, මෝටර් සහ මෝටර් පාලන පද්ධති, ගිනි ආරක්ෂණ හා හඳුනාගැනීමේ පද්ධති, ATS (Automatic Transfer Switch), ස්වයංක්‍රීය පද්ධති (Automation), සහ UPS/AVR පද්ධති සමඟ ප්‍රායෝගික අත්දැකීම් තිබීම

• අවම මගපෙන්වීමක් යටතේ ස්වාධීනව වැඩ කිරීමට හැකියාව තිබිය යුතුය.

- **<u>වෙනත්</u>**

• ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

• තනතුරට අදාළ කාර්යභාරයන් නිසි ලෙස ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.

• යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

**වැටුප: වැටුප: රු. 48,005-16x490-55,845 (මාසික) 01.01.2025 UPL 3(III)**

**බඳවා ගැනීමේ ක්‍රමය:** සම්මුඛ පරීක්ෂණය හා වෘත්තීය (Trade/ Professional) පරීක්ෂණයක් මඟින්.

**<u>අදාළ කොන්දේසි:</u>**

01. UCSC වෙබ් අඩවියේ (https://www.ucsc.cmb.ac.lk/vacancies) ඇති අදාළ මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.

02. සියළුම අයදුම් කරුවන් මාර්ගගත ක්‍රම වේදය ඔස්සේ ඉදිරිපත් කරන ලද අයදුම්පත බාගත කර එම දෘඩ පිටපත (Hard Copy) නියෝජ්‍ය ලේඛකාධිකාරී,ආයතන අංශය,කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය (UCSC),35 රීඩ් මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026.08.10 දින හෝ ඊට පෙර යොමු කළ යුතු අතර ඉහත උඩුගත කරන ලද සියලු ලේඛන සහ සහතිකවල පිටපත් අයදුම්පත සමඟ එවිය යුතුය. ඉහත අයදුම් පත්‍රය බහාලන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"විදුලි කාර්මික III ශ්‍රේණිය"** යනුවෙන් සඳහන් කළ යුතුය.

03. අපේක්ෂකයන් කෙටි ලැයිස්තුගත කිරීමේ (shortlist) අයිතිය කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය (UCSC) සතුය. අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, අසම්පූර්ණ,අපැහැදිලි හෝ UCSC වෙබ් අඩවියේ නියමිත ආකෘතියට අනුව ඉදිරිපත් නොකරන ලද ,නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. වෘත්තීය පරීක්ෂණය අදාළ වන තනතුරු සඳහා ආපසු නෙගෙවනු ලබන සේවා ගාස්තු වශයෙන් රු.1500/-ක මුදලක් අයකරනු ලැබේ.මෙම ගෙවීම ඕනෑම බැංකු කාඩ්පතක් (debit card or credit card) මඟින් සිදුකළ හැකි අතර,ගාස්තු ගෙවිය යුත්තේ මාර්ගගත අයදුම්පත් පද්ධතියේ ඇති ගෙවීම් ක්‍රමය හරහා පමණි.

**ඉහත තනතුරට අදාළ වෙනත් ප්‍රතිලාභ:**

i) අර්ථසාධක අරමුදල (University Provident Fund)
සේවකයාගේ වැටුපෙන් 10% ක් හා සේවාදායකයා විසින් 15% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලැබේ.

ii) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (Employees' Trust Fund)
සේවාදායකයා විසින් වැටුපෙන් 3%ක් බැර කරනු ලැබේ.

**අධ්‍යක්ෂ**
**කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය**
**අංක 35, රීඩ් මාවත,**
**කොළඹ 07.**
**2026.07.19**